ජනාදරයට පාත්‍ර වූ තරු සහ ප්‍රකට පුද්ගලයින්ගේ දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තා කිරීමේදී, මාධ්‍ය වඩාත් ප්‍රවේසම් විය යුතු වේ. මන්ද යත්, සාමාන්‍ය පුද්ගලයන්ගේ දිවි තොර කරගැනීම් වලට වඩා, ජනප්‍රිය පුද්ගලයින්ගේ දිවි තොර කරගැනීම් වැඩි අවධානයක් ලබා ගැනීමට සහ සමාජයට වඩාත් ඉහළ බලපෑමක් කිරීමට සමත් වීම හේතුවෙනි. ඒ ඔස්සේ දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ ඉහළ ඉඩක් පවතී.
* එසේම, එවැනි පුවත් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම අවශ්‍ය වේ.
ජනප්‍රිය දකුණු කොරියානු කේ-පොප් ගායක මූන්බින්ගේ මරණය සම්බන්ධයෙන් පළ වී තිබූ දේශීය පුවත් වාර්තාවන් සමග, හදිසි උපකාරක අංක පළ වී නොතිබීම කණගාටුවට කරුණකි.
කෙසේ නමුත්, මේ සම්බන්ධයෙන් BBC News ජාත්‍යන්තර මාධ්‍ය තුළ, පළ වූ වාර්තාවන් සමඟ හදිසි උපකාරක අංක පළ වී තිබීම, දිවි තොර කරගැනීම් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳ නිදසුනකි.
අවසානයට, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් ප්‍රවේසම් සහගත වීමත්, මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුගත වීමත්, මාධ්‍ය අත රැඳි සමාජ වගකීමක් බව අපි මෙසේම පවසමු.
මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://cmhlp.org/.../Resource-2-SPIRIT-Media-Guidelines...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

